ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date. 2023 - 08 - 17

පැමිණිලි පාර්ශවය : ආර්.ඩබ්.ඒ. රඹුක්වැල්ල මිය,
අංක. 110, තලගුනේ,
උඩදුම්බර.

වගඋත්තර පාර්ශවය : සභාපති,
උඩදුම්බර ප්‍රාදේශීය සභාව,
උඩදුම්බර.

පැමිණිලි අංකය : HRC/KND/399 /22/M

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාර ආර්.ඩබ්.ඒ.රඹුක්වැල්ල මිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමාගේ පියා වන ආර්.එන්.එස්.බී.රඹුක්වැල්ල මහතාට අයත් පිඹුරු අංක 60044 හා ඔප්පු අංක 103 ට දරණ ඉඩමේ අයිතිය පිය උරුමයෙන් අයිති කරගෙන ඇති බවත්, එම ඉඩමෙහි කොටසක 2004 වන වර්ෂයේදී රජයේ මුදල් වියදම් කර දැඩි විරෝධතා මධ්‍යයේ උඩදුම්බර ප්‍රාදේශීය සභාව විසින් ප්‍රජාශාලාවක් ඉදිකර ඇති බවත්ය. ඉන්පසු එම සිද්ධිය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කිරීමෙන් පසු එම සිද්ධියට අදාළ විමර්ශනයක් පවත්වා ඇති අතර, විමර්ශනය අවසානයේදී පළාත් පාලන කොමසාරිස් විසින් බලහත්කාරයෙන් කර ඇති ඉදිකිරීම විධිමත් කර සභාව වෙත පවරාගෙන වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සභාවට දන්වා ඇති බවත් සඳහන් කර ඇත.

තවද මහනුවර මහියංගන මාර්ගය පුළුල් කිරීමේදී මෙම ප්‍රජා ශාලාව කඩා ඉවත් කිරීමට තීරණය වී ඇති නමුත් එය ඉවත් කර නොගෙන තවදුරටත් ප්‍රජා ශාලාවේ යාබද කොටසක් ද ඉදිකර ඇති බවත්, මාර්ගය ඉදිකිරීමේදී කිසියම් කොටසක් සඳහා පැමිණිලිකරුට වන්දි මුදල් ලබා දී ඇති අතර, ප්‍රජා ශාලාව ඇති කොටසට වන්දි මුදල් ලබා දී නොමැති බවත්, වන්දි ලබා දී ඇති කොටස අත්හැර ඉතිරි කොටස මිළදී ගැනීම සඳහා මිනින්දෝරු ලවා මැනුම් කටයුතු සිදුකර පිඹුරු පත් සකස් කර ඇති අතර, තක්සේරු කිරීම වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර එම ආයතනය විසින් තක්සේරු මුදලක් සකස් කර ප්‍රාදේශීය සභාවට ඒවා ඇති බවද දක්වා ඇත. එහෙත් ප්‍රාදේශීය සභාව විසින් එම මුදල් ගෙවා භූමිය අත්පත් කරගැනීමට නොහැකි බවට අත්තනෝමතික ලෙස තීරණය කිරීම මඟින්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmai
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.l

පැමිණිලිකරුගේ ඉඩම නිදහසේ භුක්ති විදීමට ඇති අයිතිය අහිමි කර ඇති බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

**වගඋත්තරකාර සභාපතිවරයාගේ ලිඛිත කරුණු දැක්වීම :-**

මෙම පැමිණිලිකරුගේ පියා වන එම්.ඩබ්.එස්.බී.රඹුක්වැල්ල මහතාට අයත් පිඹුරු අංක 60044 හා ඔප්පු අංක 103 ට දරණ ඉඩමෙහි මෙම තැම්මිටියාන ප්‍රජාශාලාව 2003 වර්ෂයේ සිට ඉදිකර ඇති අතර, කිසිදු විරෝධතාවයක් ලැබී නොමැති බවත්, 2015 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම නගා සිටුවීමේ වැඩසටහන යටතේ රජයෙන් රු 392,000/- ක මුදලක් වැයකර මෙම ප්‍රජාශාලාව උදපිටවල ගොවි සංවිධානය විසින් ප්‍රතිසංස්කරණය කර ඇති බවද දක්වා ඇත. මේ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් සිදුකර විධිමත්ව ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට උපදෙස් ලබා දෙන ලද බවද, ඒ අනුව මැනුම් කටයුතු සිදු කිරීමට යාමේදී ප්‍රාදේශීය ලේකම්ගේ KDS/UDB/4/1/3/34 අංක හා 2016.10.13 දිනැති ලිපිය මඟින් මෙම ඉඩම පෞද්ගලික මිනින්දෝරු මහතෙකු ලවා මැනුම් කටයුතු සිදුකර ගන්නා ලෙස දන්වන ලද බවත්, ඒ අතරතුර පැමිණිලිකරු විසින් වන්දි මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත් දක්වා ඇත. මේ සම්බන්ධව ගරු මහා සභාවට ද යෝජනාවක් ඉදිරිපත් කර නීතිමය උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමටද මහා සභාව තීරණය කර ඇති බවද දක්වා ඇත. ප්‍රාදේශීය සභාව අඩු ආදායම් ලබන සභාවක් නිසා මෙම සිදුවීම පූර්වාදර්ශයක් ලෙස ඉදිරියේදී ගැටළුකාරී තත්වයක් මතුවිය හැකි බැවින් නීතිමය උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරන බවද වැඩිදුරටත් දන්වා ඇත.

**වගඋත්තර පාර්ශවීය වාචික කරුණු දැක්වීම :-**

2023.01.10 දින පරීක්ෂණයේදී වග උත්තර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.එම්.ආර්.එන්.දිසානායක මිය හා තාක්ෂණ නිලධාරි යූ.කේ.එස්.එල්.කුලරත්න මහතාගේ කරුණු දැක්වීම වන්නේ ද 2003 වසරේ සිට අදාළ ඉඩම් කොටසේ ප්‍රජා ශාලාවක් ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර පවත්වාගෙන යන අතර, 2016 වසරේදී පැමිණිලිකරු විසින් ඉඩමට අදාළ වටිනාකම් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්ය. ඒ අනුව ඉඩමේ වටිනාකම් තක්සේරු කර ඇති අතර, අදාළ වටිනාකම් ගෙවීමට සිදුවුවහොත් එය පූර්වාදර්ශයක් කරගෙන සභාව විසින් අත්පත් කරගෙන ඇති අනෙකුත් ඉඩම්වලට වන්දි ගෙවීමට සිදුවිය හැකි බවද දක්වා ඇත. එසේම මෙම ප්‍රාදේශීය සභාව අඩු ආදායම් ලබන ආයතනයක් වන බැවින් වන්දි ගෙවීමක් සිදුකිරීමට නොහැකි බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු /නිරීක්ෂණ :-**

අදාළ පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු හා ලේඛන අනුව කොමිෂන් සභාවට පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත.

ආර්.ඩබ්.ඒ.රඹුක්වැල්ල මියගේ පියා වන එම්.ඩබ්.එස්.බී.රඹුක්වැල්ල මහතාට අයත් පිඹුරු අංක 60044 ඔප්පු අංක 103 ට දරණ ඉඩමේ මෙම තැම්මිටියාන ප්‍රජා ශාලාව උඩදුම්බර ප්‍රාදේශීය සභා විසින් ඉදිකර ඇත.

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය උඩදුම්බර විසින් 2016.10.13 වන දිනැති ලිපිය මඟින් තැම්මිට්ටියාන ප්‍රජා ශාලාව ඉදිකර ඇති ඉඩම පුද්ගලික ඉඩමක් බැවින් පෞද්ගලිකව මිනින්දෝරුවෙකු ලවා මැනුම් කර පරිත්‍යාගයක් ලෙස භාරගත හැකි බවත්, ඉඩම අත්පත් කරගැනීමට අවශ්‍ය වන්නේනම් අත්පත් යෝජනා ඉදිරිපත් කලයුතු බවත් සඳහන් කිරීමෙන්ම මෙම ප්‍රජා ශාලාව පුද්ගලික ඉඩමක ඉදිකර ඇති බවත්,

2016.03.21 දිනැති පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති ලිපිය අනුව, තැම්මිටියාන ප්‍රජා ශාලාවට අදාළව ප්‍රාදේශීය සභාව සතු ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන පරීක්ෂා කිරීමේදී ප්‍රජා ශාලාව ලේඛන ගත කර නොමැති බව නිරීක්ෂණය වන නමුත් රජයේ මුදල් වැය කර ප්‍රජා ශාලාව ඉදිකර ඇති බැවින් මෙම ප්‍රජා ශාලාව විධිමත්ව පවරා ගැනීමට කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත උපදෙස් ලබා දී ඇති බවත්,

එම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි පී.වී.එම්.බස්නායක මහතාගෙන් අත්සනින් යුතු 2016.04.18 දිනැති ලිපිය මඟින් ප්‍රජා ශාලාව හා ඉඩමේ අයිතිය සභාව සතු බව සනාථ කර ගැනීමට නොහැකි වී ඇති බැවින් වහාම ඒ පිළිබඳ අවධානය යොමු කර ඊට අදාළ අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට දැනුම් දී ඇති බවත්,

2022.03.24 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තැම්මිටියාන ප්‍රජාශාලාව පිහිටි ඉඩම තක්සේරු කර පිඹුරු අංක 3318 හී කැබලි අංක 1 බි දරණ ප්‍රමාණයක් පර්චස් 4.60 ක් වන ඉඩම් කොටස උඩදුම්බර ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීම සඳහා වෙළඳ පොළ වටිනාකම රු.690,000/- ලෙස තක්සේරු කර ඇති බවත්,

2022.05.24 දින මහා සභාවේදී තැම්මිටියාන ප්‍රජා ශාලාව සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා වන යෝජනාව ඉදිරිපත් කිරීමේදී ගරු සභාපතිතුමා විසින් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම ලෙස රු 690,000 වාර්තා වී ඇති බව පැවසුණු අතර, මහාසභාව විසින් කාරක සභා පැවැත්වුණු අවස්ථාවේදී සාකච්ඡා කළ පරිදි නීති උපදෙස් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

2022.05.09 වන දිනැති නීතිඥ දයානන්ද හපුආරච්චි මහතාගේ උපදෙස් අනුව ප්‍රජාශාලාව ඉදිකර ඇති ඉඩම් සභාව සතු ඉඩමක් නොවන්නේනම් එම ඉඩම සඳහා එහි අයිතිකරු යම් විකුණුම් මිලක් ඉල්ලා සිටින අවස්ථාවකදී 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි රජයේ තක්සේරුවක් මත වන්දි ගෙවීම කළ යුතු බව දන්වා ඇති බව ද පැහැදිලි වේ.

නිගමනය :-

උඩදුම්බර ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය විසින් 2016.10.13 දිනැති ලිපියෙන් සඳහන් කර ඇති පරිදි "තැම්මිටියාන ප්‍රජා ශාලාව ඉදිකර ඇති ඉඩම පෞද්ගලික ඉඩමක් වන බැවින් මිනින්දෝරු මහතෙකු ලවා මැනුම් කර පරිත්‍යාග ලෙස භාරගත හැකි බවත්, අත්පත් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් අත්පත් යෝජනා ඉදිරිපත් කළ යුතු බවත්" දැනුම් දීම තුළින් නිගමනය කරනුයේ ප්‍රාදේශීය සභා විසින් අදාළ ඉඩම අනීතිකව භුක්ති විඳින බවයි.

උඩදුම්බර ප්‍රාදේශීය ලේකම්, පළාත් පාලන කොමසාරිස්, සහකාර පළාත් පාලන කොමසාරිස්, හා ප්‍රාදේශීය සභාවේ නීතිඥවරයා විසින් අදාළ ඉඩම නීත්‍යානුකූලව පවරාගෙන ඉඩම තක්සේරු කර වන්දි ගෙවීමක් සිදුකළ යුතු බව දැනුම්දී තිබියදී උඩදුම්බර ප්‍රාදේශීය සභා සභාපති විසින් ඒ පිළිබඳ කිසිදු සැළකිල්ලක් නොගෙන ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කරගෙන ඇති අනෙකුත් ඉඩම් හිමියන්ද මෙම සිද්ධිය පූර්වාදර්ශයක් කරගෙන වන්දි ඉල්ලුවහොත් ගැටළු සහගත තත්වයක් උදාවන බැවු සඳහන් කරමින් පැමිණිලිකරු වන ආර්.ඩබ්.ඒ. රඹුක්වැල්ල මියගේ ඉඩමට වන්දි ගෙවීම පැහැර හැර ඇති බවද කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

කොමිෂන් සභාව විසින් 2022.11.04 දිනැතිව ප්‍රාදේශීය සභාවට යොමු කර ඇති ලිපියට පිළිතුරු වශයෙන් 2022.11.25 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති ලිපිය මඟින් සඳහන් කර ඇත්තේ කිසිදු ගෙවීමක් සිදු කළ නොහැකි බව වන නිසා, පෞද්ගලික ඉඩමක් බලහත්කාරයෙන් ප්‍රාදේශීය සභාව විසින් විධිමත් නොවන ලෙස අත්පත් කර ඉදිකිරීමක් සිදු කර ඇති බව පෙනී යයි.

වගඋත්තර පාර්ශවය වන උඩදුම්බර ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් 2022.11.25 දිනැති ලිපිය මඟින් 'භුක්ති අයිතිය යටතේ අදාළ ඉඩම් කොටස ප්‍රාදේශීය සභා සතු බව' ප්‍රකාශ කළ ද එයින් නීත්‍යානුකූල පදනමක් නොමැති බවත් එවැනි අයිතියක් ප්‍රකාශ කරන්නේ නම් එම අයිතිය අධිකරණය මඟින් විසඳා ගත යුතුව පවතින බවත් නිගමනය කරමු.

මේ අනුව පැමිණිලිකාර ආර්.ඩබ්.ඒ.රඹුක්වැල්ල මියගේ පෞද්ගලික ඉඩම තුළ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රජා ශාලාවක් ඉදිකර ඇති අතර, එම ඉඩමට තක්සේරු වටිනාකම් ගෙවා විධිමත් ලෙස පවරා නොගැනීම තුළින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවටත් මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටිමු.**

පැමිණිලිකාර ආර්.ඩබ්.ඒ.රඹුක්වැල්ල මියගේ පෞද්ගලික ඉඩම තුළ, එම ඉඩමට තක්සේරු වටිනාකම් ගෙවා විධිමත් ලෙස පවරා ගැනීමකින් තොරව, ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට කටයුතු කර ඇති බැවින් එකී ඉඩමට අදාළ තක්සේරු වටිනාකම ගෙවිය යුතුය.

කෙසේ වෙතත්, එහිදී අදාළ කොටසට තක්සේරු කර ඇත්තේ, ප්‍රජා ශාලාවද සැළකිල්ලට ගෙන නම්, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් එකී ප්‍රජාශාලාව වෙනුවෙන් කරනු ලැබූ තක්සේරු මුදල හැර, කර ඇති තක්සේරු මුදලින් ඉතිරි මුදල පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.

2023.09.15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත,
පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ.

02. ප්‍රධාන තක්සේරුකරු,
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත් I කාර්යාලය,
75, NHDA ගොඩනැගිල්ල, යටිනුවර වීදිය, මහනුවර.

03. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

12(1)

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date. } 2023/08/18

පැමිණිලි පාර්ශවය : ආර්.ඩබ්.ඒ. රඹුක්වැල්ල මිය,
අංක. 110, තලගුනේ,
උඩුදුම්බර.

වගඋත්තර පාර්ශවය : සභාපති,
උඩුදුම්බර ප්‍රාදේශීය සභාව,
උඩුදුම්බර.

**පැමිණිලි අංකය : HRC/KND/399 /22/M**

වෙත :- රුවිනි දිසානායක මිය,
ලේකම්,
උඩුදුම්බර ප්‍රාදේශීය සභාව,
උඩුදුම්බර.

ඉහත අංක දරණ පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.08.17 දිනැතිව නිර්දේශයක් නිකුත් කර ඇති අතර, එම නිර්දේශයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

එම නිර්දේශයේ වගඋත්තර පාර්ශවය වශයෙන්, සභාපති, උඩුදුම්බර ප්‍රාදේශීය සභාව නම් කර ඇත. එහෙත්, මේ වන විට ප්‍රාදේශීය සභා කාලය අවසන්ව ඇති බැවින්, ප්‍රාදේශීය සභාවේ කටයුතු කිරීමේ බලය 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ලේකම්වරයා ලෙස ඔබ වෙත පැවරී ඇත. මේ අනුව අදාළ නිර්දේශය 2023.09.15 දිනට පෙර ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසට මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

අධ්‍යක්ෂ ( පරීක්ෂණ හා විමර්ශන)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- 01. පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත,
පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ.

02. ප්‍රධාන තක්සේරුකරු,
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත් I කාර්යාලය,
75, NHDA ගොඩනැගිල්ල, යටිනුවර වීදිය, මහනුවර.